SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර I විභාගය - 2023 ජනවාරි

## යෝජිත උත්තර

# (101) මූල්‍ය ගිණුම්කරණය (FAC)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර I විභාගය - 2023 ජනවාරි**

# (101) මූල්‍ය ගිණුම්කරණය

# යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

**1.1** (3)

**1.2** (4)

**1.3** (2)

| | | |
|---|---|---|
| 1.4.2020 පිරිවැය | - | රු. 5,000,000 |
| 31.3.2021 දිනට ධාරණ අගය | - | රු. 3,750,000 |
| 31.3.2022 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ක්ෂය | - | 3,750,000×25% = **රු. 937,500** |

**1.4** (2)

**1.5** (4)

| | **රු.** |
|---|---|
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | 375,000 |
| + ඉදිරිපත් නොකළ චෙක්පත් | 15,000 |
| - උපලබ්ධි නොවූ චෙක්පත් | (24,000) |
| මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය | **366,000** |

**1.6** (2)

**1.7** (1)

**1.8** (2)

**1.9** (1)

| | **රු.** |
|---|---|
| 2021.04.01 දිනට ප්‍රාග්ධනය | 5,000,000 |
| වර්ෂය තුල ගැනිලි | (600,000) |
| **ශුද්ධ ලාභය** | **1,400,000** |
| මුළු වත්කම් (7,500,000 - 1,700,000) | 5,800,000 |

**1.10** (2)

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20)***

**1.11** අසත්‍යයි

**1.12** අසත්‍යයි

**1.13** සත්‍යයි

**1.14** සත්‍යයි

**1.15** අසත්‍යයි

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10)***

**1.16** ස්කන්ධය හෙවත් හිමිකම යනු ව්‍යාපාරයක මුළු වත්කම් වලින් සියළුම බැරකම්/ වගකීම් ඉවත්කළ පසු ඉතිරිවන ප්‍රමාණය වේ.

***(ලකුණු 02 )***

**1.17 මූල්‍ය කළමණාකරණය හා කළමණාකරණ ගිණුම්කරණය අතර වෙනස**

| සාධකය / ලක්ෂණය | මූල්‍ය කළමණාකරණය | කළමණාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| **තොරතුරු භාවිතා කරන පාර්ශවයන්** | අභ්‍යන්තර හා බාහිර යන සියලු පාර්ශවයන් | ආයතනික අභ්‍යන්තර පාර්ශවයන් සඳහා පමණක් |
| **තොරතුරු වල ස්වාභාවය** | ඓතිහාසික තොරතුරු පමණක් යොදා ගනී | ඓතිහාසික වර්තමාන සහ අනාගත යන සියලු තොරතුරු යොදා ගනී |
| **වාර්තාකරණ කාලච්ඡේදය** | යම් නිශ්චිත කාලච්ඡේදයක් සඳහා | කළමණාකරණය ඉල්ලුම් කරන ඕනෑම කාලච්ඡේදයක් සඳහා |
| **නීතිමය අවශ්‍යතා** | විවිධාකාර වූ නිතිමය නියමයන් සහ අවශ්‍යතාවයන් අදාළ වේ | නිශ්චිත ආකෘති නොමැති අතර කළමණාකාරිත්ව අවශ්‍යතාවයන් මත පදනම් වේ |
| **තොරතරු ආකෘතිය** | නිශ්චිත ආකෘතින් අදාළ වේ | නිශ්චිත ආකෘතින් නොමැති අතර කළමණාකාරිත්ව අවශ්‍යතාවයන් මත පදනම් වේ |
| **වාර්තා සකස් කිරීම** | සමස්ත ආයතනය එක් ඒකකයක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරයි | ආයතනික අභ්‍යන්තර අංශ දෙපාර්තමෙන්තු ශාඛාවන් සඳහා වෙන වෙනම කළමණාකරණ වාර්තා පිළියෙළ කරයි |

***(ලකුණු 02 )***

**1.18**

1 ව්‍යාපාරික ආචාරධර්ම යනු ව්‍යාපාර ක්‍රියාකාරකම් පාලනය කිරීම, දේශීය වෙළඳාම, අල්ලස්, වෙනස් කොට සැලකීම, ආයතනික සමාජ වගකීම් යනාදී මතභේදාත්මක ක්ෂේත්‍ර සඳහා සුදුසු ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයයි. සරලව විග්‍රහ කළහොත් අයිතිකරුවන් ඇතුළුව ව්‍යාපාරයට උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ගේ අරමුණු සහ අභිමාතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික කාර්යයන් සැලසුම් කිරීම සඳහා සුදුසු ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් භාවිතා කිරීමයි.

2 ව්‍යාපාර ආචාරධර්ම ආයතනික ප්‍රමිතීන්, ප්‍රතිපත්ති, වටිනාකම් සහ සම්මතයන් වෙත අදාළ වේ.

3 ව්‍යාපාර ආචාරධර්ම යනු ව්‍යාපාර සඳහා නියමිත චර්යාධර්ම සංග්‍රහයයි.

*(ලකුණු 02 )*

**1.19 විශේෂිත ගිණුම්කරණ මෘදුකාංග**

1 ණයගැති පාලන මෘදුකාංග

2 ණයහිමි පාලන මෘදුකාංග

3 විකුණුම් පාලන මෘදුකාංග

4 තොග පාලන මෘදුකාංග

*(ලකුණු 02 )*

**1.20 මූලික සටහන් පොත් පවත්වාගෙන යාමේ වැදගත්කම / අරමුණු**

1 එය ගනුදෙනුවේ සාක්ෂි/ලිඛිත සාක්ෂියක් ලෙස ක්‍රියා කරයි.

2 එය මූලික සටහන් පොත්වල ගනුදෙනු සහ සිදුවීම් වාර්තා කිරීම සඳහා සහාය වේ.

3 එය ගනුදෙනු වලංගු කිරීමට සහාය වේ.

4 එය දෝෂ ඇතිවීමේ හැකියාව අවම කරයි.

5 එය අවසන් ගිණුම් පිළියෙළ කිරීමට උපකාරී වේ.

6 එය අනාගත සාක්ෂියක් ලෙස භාවිතා කරයි.

*(ලකුණු 02 )*

*(මුළු ලකුණු 40)*

aat SRI LANKA

***A කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 40 )

**B කොටස**

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 03 – මූලික සටහන් පොත්, පාලන ගිණුම් සහ ශේෂ පිරික්සුම*

**අනිෂ් ට්‍රේඩර්ස්**

2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම **(රු.'000)**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 5,000 |
| විකුණුම් (3,200+3,350) **(W1)** | | 6,550 |
| ගැනුම් (2,100+2,890) **(W2)** | 4,990 | |
| විදුලිය (25+100) | 125 | |
| යන්ත්‍ර සූත්‍ර | 3,000 | |
| ක්ෂය (3,000,000 × 25% × 3/12) | 187.5 | |
| සමුච්චිත ක්ෂය | | 187.5 |
| වැටුප් හා වේතන | 1,300 | |
| කාර්යාල කුලිය (600-100) | 500 | |
| බැංකුවේ ඇති මුදල් | 350 | |
| වෙළෙඳ ණය ගැතියෝ | 1,950 | |
| උපචිත වියදම් | | 25 |
| කලින් ගෙවූ කාර්යාල කුලිය | 100 | |
| වෙළෙඳ ණය හිමියෝ | | 740 |
| | **12,502.5** | **12,502.5** |

aat SRI LANKA

**W1**

**වෙළෙඳ ණය ගැතියෝ** **(රු.'000)**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 3,350 | මුදල් | 1,400 |
| | | ශේෂය ප/ගෙ | 1,950 |
| | 3,350 | | 3,350 |

**W2**

**වෙළෙඳ ණය හිමියෝ** **(රු.'000)**

| | | | |
|---|---|---|---|
| මුදල් | 2,150 | ගැනුම් | 2,890 |
| ශේෂය ප/ගෙ | 740 | | |
| | 2,890 | | 2,890 |

*(මුළු ලකුණු 10)*

*තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 04 (II) - නිෂ්පාදන පිරිවැය ලේඛන පිළියෙළ කිරීම***

**කළුවර ෆ්රනිච්රස්**
**2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**නිෂ්පාදන ගිණුම**

| | රු. | රු. |
|---|---|---|
| **සෘජු අමුද්‍රව්‍ය පිරිවැය** | | |
| ආරම්භක අමුද්‍රව්‍ය තොගය | | 600,000 |
| එකතු කළා : අමුද්‍රව්‍ය ගැණුම් | 4,700,000 | |
| ගෙන ඒමේ කුලී | 185,000 | 4,885,000 |
| පරිභෝජනයට තිබූ ද්‍රව්‍ය පිරිවැය | | 5,485,000 |
| අඩු කළා : අවසන් අමුද්‍රව්‍ය තොගය | | (650,000) |
| **පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය** | | 4,835,000 |
| | | |
| **සෘජු ශ්‍රම පිරිවැය** | | |
| සෘජු වැටුප් | | 600,000 |
| **ප්‍රාථමික පිරිවැය** | | **5,435,000** |
| | | |
| **පොදුකාර්ය පිරිවැය** | | |
| රක්ෂණය | 200,000 | |
| කම්හල් කළමනාකරුගේ වැටුප් | 680,000 | |
| විදුලිය (720,000 × 75%) | 540,000 | |
| ජලය (300,000 × 40%) | 120,000 | |
| කුළිය (800,000 × 60%) | 480,000 | |
| ක්ෂය - යන්ත්‍රෝපකරණ | 350,000 | |
| - ගොඩනැගිලි | 600,000 | 2,970,000 |
| **නිමකළ භාණ්ඩවල පිරිවැය** | | 8,405,000 |
| අවසන් නොනාමි | | (250,000) |
| | | 8,155,000 |
| ලාභය 25% | | 2,038,750 |
| **වෙළෙඳ ගිණුමට මාරු කලා** | | **10,193,750** |

*(ලකුණු 10)*

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 02 - ගිණුම්කරණ සමීකරණය, ද්විත්ව සටහන් න්‍යාය සහ ගිණුම්කරණ සංකල්ප*

**(A)**

1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අයිතිකරු මූලික ප්‍රාග්ධනය ලෙස රු 2,000,000 ක් මුදලින් යෙදවීම.
2. රු.750,000 වන ලී බඩු රු.150,000 ක් මුදලින් ගෙවා ඉතිරිය පසුව ගෙවීමේ පදනම මත මිලදී ගැනීම.
3. නැවත විකිණීම සඳහා රු.300,000 ක් වටිනා තොග ණයට මිලදි ගැනීම.
4. රු.450,000 ණය හිමියන්ට ගෙවීම.
5. පිරිවැය රු.145,000 ක් වටිනා තොග රු.180,000 කට ණයට විකිණීම.

*(ලකුණු 05)*

*පරිච්ඡේදය 05 - බැංකු සැසඳුම් ප්‍රකාශන*

**(B) (a)**

**ගැලපූ මුදල් පොත**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 250,000 | රක්ෂණය | 50,000 |
| සෘජු තැන්පතු/ ණයගැති | 38,000 | බැංකු ගාස්තු | 500 |
| | | ශේෂය ප/ගෙ | 237,500 |
| | 288,000 | | 288,000 |

*(ලකුණු 02)*

SRI LANKA

**(b)**

**2022.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | |
|---|---|
| මුදල් පොතට අනුව ශේෂය | 237,500 |
| **එකතු කළා:** | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | 75,000 |
| බැංකුවේ වැරදි | 2,500 |
| | 315,000 |
| **අඩු කළා:** | |
| තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ චෙක්පත් | (120,000) |
| **බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය** | **195,000** |

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10)*

**පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ**

**පරිච්ඡේදය 03 – මූලික සටහන් පොත්, පාලන ගිණුම් සහ ශේෂ පිරික්සුම**

**(A) (a)**

**පොදු ජර්නලය**

| | විස්තරය | | හර | බැර |
|---|---|---|---|---|
| 1 | විකුණුම් ගිණුම | හර | 135,000 | |
| | වෙළඳ ලැබිය යුතු පාලන ගිණුම | බැර | | 135,000 |
| | (විකුණුම් ගිණුම නිවැරදි කිරීම) | | | |
| 2 | වෙනත් ණය හිමියන්ගේ ගිණුම (AT කුර්රේ සමාගම) | හර | 117,000 | |
| | කාර්යාල උපකරණ ගිණුම | බැර | | 117,000 |
| | (දෙවරක් වාර්තා කරන ලද ණය පදනම මත කාර්යාල උපකරණ මිලදී ගැනීම නිවැරදි කිරීම) | | | |
| 3 | කුලී වියදම් ගිණුම | හර | 65,000 | |
| | කුලී ආදායම් ගිණුම | හර | 65,000 | |
| | අවිනිශ්චිත ගිණුම | බැර | | 130,000 |
| | (කුලී වියදම් ගිණුම නිවැරදි කිරීම) | | | |
| 4 | දුරකථන වියදම් ගිණුම | හර | 9,000 | |
| | අවිනිශ්චිත ගිණුම | බැර | | 9,000 |
| | (දුරකථන වියදම් ගිණුම නිවැරදි කිරීම) | | | |
| 5 | ගෘහ භාණ්ඩ සහ උපාංග ගිණුම | හර | 220,000 | |
| | අලුත්වැඩියා සහ නඩත්තු ගිණුම | බැර | | 220,000 |
| | (ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ගිණුම නිවැරදි කිරීම) | | | |

*(ලකුණු 05)*

**(b)**

**අවිනිශ්චිත ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 139,000 | කුලීය | 130,000 |
| | | දුරකථන වියදම් | 9,000 |
| | 139,000 | | 139,000 |

*(ලකුණු 02)*

aat SRI LANKA

**(B)**

**වෙළෙඳ ණයගැති පාලන ගිණුම** **(රු.'000)**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 5,500,000 | ආපසු එවුම් | 500,000 |
| විකුණුම් | 3,650,000 | මුදල් | 1,800,000 |
| | | බොල් ණය | 10,000 |
| | | ශේෂය ප/ගෙ | 6,840,000 |
| | 9,150,000 | | 9,150,000 |

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10)*

***B කොටසෙහි අවසානය***

*(මුළු ලකුණු 20)* **C කොටස**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**(a)**

*පරිච්ඡේදය 04 (I) - ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම*

**අමල් ට්‍රේඩර්ස්**
2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
**විස්තීරණ ආදායම් ප්‍රකාශනය** **(රු.'000)**

| | | |
|---|---|---|
| විකුණුම් | | 252,000 |
| **විකුණුම් පිරිවැය :** | | |
| ආරම්භක තොගය | 12,150 | |
| ගැනුම් | 177,000 | |
| ගැනුම් මත ආනයන තීරු බදු | 1,500 | |
| | 190,650 | |
| (-) අවසාන තොගය | (7,750) | (182,900) |
| **දළ ලාභය** | | **69,100** |
| **බෙදාහැරීමේ වියදම්** | | |
| මෝටර් රථ ක්ෂය **(W1)** | 125 | |
| බොල් ණය | 75 | |
| ප්‍රවාහන වියදම් | 4,800 | (5,000) |
| **පරිපාලන වියදම්** | | |
| ක්ෂය - යන්ත්‍රෝපකරණ **(W1)** | 600 | |
| - පරිගණක **(W1)** | 450 | |
| කුලිය | 6,000 | |
| ජලය (150+22) | 172 | |
| විදුලිය (3,450+75) | 3,525 | |
| වැටුප් හා වේතන | 45,000 | |
| දුරකථන හා අන්තර්ජාල ගාස්තු | 500 | (56,247) |
| **මූල්‍ය වියදම්** | | |
| ණය පොලී (1200+100) | 1,300 | (1,300) |
| **ශුද්ධ ලාභය** | | **6,553** |

*(ලකුණු 11)*

**(b)**

අමල් ට්‍රේඩර්ස්

2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(රු.'000)**

| | පිරිවැය | සමු. ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| යන්ත්‍රෝපකරණ | 3,000 | 2,100 | 900 |
| පරිගණක | 1,800 | 900 | 900 |
| මෝටර් රථ | 2,000 | 125 | 1,875 |
| | **6,800** | **3,125** | **3,675** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 7,750 | |
| වෙළෙඳ ණය ගැතියෝ | 20,200 - 75 | 20,125 | |
| අතැති මුදල් | | 85 | 27,960 |
| **මුළු වත්කම්** | | | **31,635** |
| **ස්කන්ධය හා හිමිකම්** | | | |
| **ස්කන්ධය** | | | |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | | 11,385 | |
| අතිරේක ස්කන්ධය | | 2,000 | |
| ශුද්ධ ලාභය | | 6,553 | 19,938 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය | | | 5,500 |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියෝ | | 6,000 | |
| උපචිත වියදම් (75+22) | | 97 | |
| ගෙවිය යුතු බැංකු ණය පොලී | | 100 | 6,197 |
| **මුළු ස්කන්ධය හා හිමිකම්** | | | **31,635** |

aat SRI LANKA

**W1 - ක්ෂය**

| | **සමුච්චිත ක්ෂය 1.4.2021** | **වර්ෂයේ ක්ෂය** | **සමුච්චිත ක්ෂය 31.03.2022** |
|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ | 1,500 | 600 | 2,100 |
| පරිගණක | 450 | 450 | 900 |
| මෝටර් රථ | | 125 | 125 |
| | **1,950** | **1,175** | **3,125** |

**වර්ෂයේ ක්ෂය**

| | | | |
|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ | 3,000 × 25% | = | 600 |
| පරිගණක | 1,800 × 25% | = | 450 |
| මෝටර් රථ | 2,000 × 25% × 1/4 | = | 125 |

*(ලකුණු 09)*

*(මුළු ලකුණු 20)*

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the “Only” answers, or, for that matter even as “Model Answers”. The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*